4 වන පිටෙන්

ප්‍රායෝගිකව අත්දැක තිබේ. එහෙත් කොට්ඨාශ ක්‍රමය තුළ අදාල මන්ත්‍රීවරයා කොට්ඨාශය තුළ ජනතා අභිලාෂයන් නොසලකා කටයුතු කළහොත් ඊළඟ මැතිවරණයේදී පරාජය විය හැකි බැවින් ඔවුන් කිසියම් ආකාරයකට ජනතා අපේක්ෂාවන් අනුව ක්‍රියා කිරීමට පෙළඹවීමක් ඇතිවේ. එමෙන්ම භූගෝලීය වශයෙන් සීමාවීම නිසාද ඔවුනට වැඩ කිරීම පහසුකරයි.

කොට්ඨාශ ක්‍රමය තුළ පවතින ජනතාවට වාසිදායක කරුණ වනුයේ තම ප්‍රදේශයේ මන්ත්‍රීවරයා ජනතා අවශ්‍යතාවය අනුව කටයුතු නොකරයි නම් දිස්ත්‍රික්කයෙහි ඕනෑම මහජන නියෝජිතයෙකු ගෙදර යැවීමට ඔවුනට හැකියාව ලැබේ. මන්ත්‍රීවරයා සම්පත් බෙදාහරින්නෙක් විය යුතුද? කොට්ඨාශයට මන්ත්‍රීවරයෙක් අවශ්‍ය යැයි අර්ථගැන්වෙන්නේ එකී කොට්ඨාශයේ පොදු මහජන අවශ්‍යතාවය සහ සංවර්ධනය, රැකියා ප්‍රශ්න වැනි විසඳා ගැනීමට සිදුව තිබෙන්නේ මන්ත්‍රීවරු හරහා නිසාවෙනි. ඒ සඳහා අවශ්‍ය සම්පත් බෙදාහැරීම 80 දශකයේ සිට මන්ත්‍රීවරයාගේ ප්‍රමුඛ කාර්යයක් බවට පත් වී ඇත. ජනතාවගේ කෝණයෙන් බැලූකල එහි සත්‍යතාවයක් පවතී. එමෙන්ම පසුගිය දශක කිහිපය තුළ ප්‍රායෝගික යාථාර්ථයද එය විය. එහෙත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගේ ප්‍රමුඛ කාර්ය විය යුත්තේ එයද? ඔහු කළ යුත්තේ මුළු රටෙහිම ආර්ථික, සමාජීය සංවර්ධනය සඳහා අවශ්‍ය නීති හා ප්‍රතිපත්ති සම්පාදනය නොවන්නේද? නොඑසේ නම් අද පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සිදුකරන පාරවල් සංවර්ධනය, පාසැල් සංවර්ධනය, දරුවන් පාසැල් වලට දැමීම, රැකියා ලබාදීම වැනි අවශ්‍යතා සාධාරණ ලෙසත් නිවැරදි ලෙසත් බෙදී යාම සඳහා අවශ්‍ය නීති සහ ප්‍රතිපත්ති සම්පාදන කර එය රාජ්‍ය යාන්ත්‍රණ හරහා විධිමත්ව සිදුවන්නේද යන්න අධීක්ෂණය කිරීම නොවේද? අද දිනයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් බොහෝමයක් සම්පත් බෙදා හැරීම හොඳින් සිදුකළද ඔවුනගේ ප්‍රමුඛ කර්යය වන නීති ප්‍රතිපත්ති සකස් කිරීමට කිසිදු වැදගත්කමක් ලබා දී නොමැති මන්ත්‍රීවරයාගේ මූලික කාර්යය එය නම් ඔහු නිශ්චිත කොට්ඨාශයක් නියෝජනය නොකලද කිසිදු ගැටළුවක් ඇති නොවනු ඇත. එමෙන්ම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා මළගෙදරට, මගුල් ගෙදරට ගෙන්වා ගැනීමේ සංස්කෘතිය වෙනස් කලයුතුව ඇත.

පවතින මැතිවරණ ක්‍රමය ගැටුම් ඇති කරයිද?

ලංකාවේ ක්‍රියාත්මක වන්නේ ලංකාවටම විශේෂ වූ මැතිවරණ ක්‍රමයකි. එය ලෝකයේ සමහර රට වල ක්‍රියාත්මක අනුපාතික මැතිවරණ ක්‍රමයට අපේක්ෂකයන් තෝරා ගැනීමක් හෙවත් මනාප ක්‍රමයක් එකතු කිරීමෙන් සාදන ලද්දකි. මෙය ප්‍රජාතන්ත්‍රවාදී අර්ථයෙන් ඉතා ප්‍රශස්ත ක්‍රමයකි. ඡන්ද දායකයාට තමා කැමති පක්ෂයත් අපේක්ෂකයාත් තෝරා ගැනීමට ඉඩකඩ ලැබේ. එහෙත් මෙම ක්‍රමය භාවිතා කිරීමේදී එකම පක්ෂයේ අපේක්ෂකයන් අතර ගැටුම් ඇති කර ගැනීම මැතිවරණ ගණනාවකදීම අප අත්දැක ඇත. එමෙන්ම සමහර මැතිවරණ වලදී ගැටුම් අවම මට්ටමක පැවති අවස්ථාද දැකිය හැක. එමෙන්ම සමහර දිස්ත්‍රික්ක තුළ කිසිදු ගැටුමක් සිදුනොවූ අවස්ථාද ඇත. මෙයින් පැහැදිලි වන්නේ එසේ ගැටුම් ඇති වීමට, ක්‍රමයට වඩා පුද්ගලයා හා භාවිතාවේ පවත්නා ගැටළු හේතු වන බවයි.



ඒ සඳහා අවශ්‍ය දියුණු දේශපාලන සංස්කෘතියක් අප රට තුළ නොතිබීම ප්‍රධාන ගැටළුවකි. මැතිවරණ වලදී ගැටුම් ඇති කර ගැනීමට මුල් වන්නේ ඉදිරිපත් වන අපේක්ෂකයන්ගෙන් 25% අඩු ප්‍රමාණයකි. එමෙන්ම සෑම මැතිවරණයකදීම ගැටුම් ඇති කර ගන්නේ එකම කණ්ඩායමක් වීමද, බොහෝ ගැටුම් වලට හේතුව රාත්‍රී කාලයේ ප්‍රචාරක පෝස්ටර් ප්‍රදර්ශනයට යාමද, ඒ සඳහා බීමත් පුද්ගලයන් යොදා ගැනීමද යන කරුණු වලින් අවධාරණය වන්නේ ගැටුම් වලට එකම හේතුව මනාප ක්‍රමය නොවන බවයි. එහෙත් මනාප ක්‍රමයද එයට යම් බලපෑමක් එල්ල කරන බව ඉවත නොදැමිය හැකි තර්කයකි. කෙසේ වෙතත් මනාප ක්‍රමය පවත්වා ගනිමින්ම වෙනත් නීතිමය තත්වයන් හා භාවිතාවන් වෙනස් කර, ගැටුම්කාරී තත්වයන් සැලකිය යුතු ප්‍රමාණයකට පාලනය කළ හැකි බව පෙනී යයි.

ඉදිරි මැතිවරණ සංශෝධනයකදී මනාප ක්‍රමය ඉවත් කිරීමට කටයුතු කරන්නේ නම් අපේක්ෂකයන් තේරීමට විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීම අනිවාර්යයෙන්ම කළ යුතු වනු ඇත. විශේෂයෙන්ම ලංකාව වැනි රටක දේශපාලන පක්ෂ වල අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදය, විනිවිදභාවය නොමැති තත්වයක් තුළ සහ පක්ෂ ක්‍රමය ස්ථාපිත වූ තත්වයක් තුළ අපේක්ෂකයන් තෝරා ගැනීමට කොට්ඨාශවලට අපේක්ෂකයන් නම් කිරීමට විනිවිද භාවයක් සහිත ක්‍රමයක් නොතිබුනහොත් පක්ෂ නායකයාගේ අභිමතය මත සියල්ල තීන්දු වනු ඇත. පක්ෂ නායකයාට යම් අපේක්ෂකයෙකු පරදා කිරීමට හෝ දිනවීමට අවශ්‍යවන්නේ නම් ඒ සඳහා පක්ෂය ස්ථාරව දිනන කොට්ඨාශයක් හෝ පරාජය වන කොට්ඨාශයක් ඒ සඳහා ලබාදිය හැක. මනාප ක්‍රමය ඉවත් කරනු ලැබුව හොත් අද පවතින ජාතික දේශපාලනයේ හැඩතලය බොහෝ දුරට වෙනස් වනු ඇත. බොහෝ ජාතික දේශපාලනඥයන් පරාජයට පත්වනු ඇත. එය වලක්වා ගැනීමට නම් ඒ ඒ දිස්ත්‍රික්කයේ සමානුපාතික ක්‍රමයට ලබාගන්නා ඡන්ද ප්‍රමාණය සැලකිල්ලට ගෙන ජයග්‍රාහී කොටඨාශ සඳහා මන්ත්‍රීවරුන් තෝරාපත් කිරීමෙන් අනතුරුව සෙසු පිරිස් හොඳම පරාජිතයන් අතරින් තෝරා ගැනීමේ ක්‍රමයක් සැකසිය යුතුය.

පවතින මැතිවරණ ක්‍රමය තුළ අපේක්ෂකයෙකු ජයග්‍රහණය කිරීමට නම් විශාල භූගෝලීය ප්‍රදේශයක් තුළ තම ප්‍රචාරක කටයුතු සිදුකළ යුතුව ඇත. එසේ කිරීමට නම් ඔහුව හෝ ඇයට ඒ සඳහා විශාල වියදමක් දැරීමට සිදුවේ. එක් අතකින් එසේ විශාල වියදමක් දරන අපේක්ෂකයෙකු ජයග්‍රහණයෙන් පසු එම මුදල් උපයාගැනීමට ක්‍රියාකරනු ඇත. එමෙන්ම මුදල් ඇති අපේක්ෂකයෙකු කිසිදු ජන පදනමක් නොමැතිව වුවද මුලු දිස්ත්‍රික්කය පුරාම ප්‍රචාරක කටයුතු බඩු-මුදල් බෙදාහැරීම සිදුකර ඡන්ද එකතු කරනු ඇත. පසුගිය මැතිවරණ ගණනාවකදී සමහර අපේක්ෂකයන් සිදුකකරන ලද අති විශාල වියදම සහ එකී වියදම් හරහා ඔවුන් ලැබූ ජයග්‍රහණ දෙස බැලීමේදී මේ බව පැහැදිලි වේ.

කලුතර දිස්ත්‍රික්කයේ එක් අමාත්‍යවරයෙකු ප්‍රසිද්ධියේම තමා ලක්ෂ 800 ක මුදලක් මැතිවරණයට වියදම් කල බව සඳහන් කළේය. ප්‍රචාරණ කටයුතු සඳහා අඩුවෙන්ම වියදම් කල බව කියන උදය ගම්මන්පිල මහතා ලක්ෂ 98 ක් වියදම් කල බව කියයි. ශ්‍රී ලාංකික සංස්කෘතියට අනුව යම් පුද්ගලයෙකුට යමක් ලැබුණහොත් පෙරලා ඒ සඳහා උපකාර කිරීමට පෙළඹේ. එවැනි ඡන්ද ලබාගැනීමට මූල්‍ය ශක්තිය ඇති අපේක්ෂකයන් සමත්වේ.

සුදුස්සන් මැතිවරණයට ඉදිරිපත් නොවන බව උගතුන් බුද්ධිමතුන් පමණක් මහජන නියෝජිතයින් ලෙස පත්විය යුතු බව පිළිගත හැකි තර්කයක් නොවූවද පවතින ක්‍රමය තුළ උගතුන් බුද්ධිමතුන් තරගකිරීමට ඇති පෙළඹවීම ඉතා අවමය. මැතිවරණයකදී දැරීමට සිදුවන අතිවිශාල වියදමක් දරමින් සහ පවතින තරගකාරීත්වයට මුහුණදෙමින් අපේක්ෂකයෙකු ලෙස ඉදිරිපත්වීමට දැනටමත් දේශපාලන ප්‍රවාහයේ සිටින බුද්ධිමතුන් හැර දේශපාලන නවකයෙකු ඒ සඳහා ඇතුල්වීමට උත්සාහ නොදරනු ඇත.

එමෙන්ම සාධාරණ ලෙස මුදල් උපයන්නන් බහුතරයක් විශේෂවූ තත්ත්වයක් හෝ බලාපොරොත්තුවක් නොවන්නේ නම් තරගකිරීමට ඉදිරිපත් නොවනු ඇත. එමෙන්ම එවැන්නෙකුට මුලු දිස්ත්‍රික්කය පුරා තම මැතිවරණ ප්‍රචාරක කටයුතු වල යෙදෙමින් සෙසු අපේක්ෂකයන් විවේචන කරමින් ජනතාවට පොරොන්දු ලබාදීමට කටයුතු නොකරනු ඇත. එබැවින් ඔවුන් මාධ්‍යය අවධානය දිනා නොගනු ඇත. එබැවින් සුදුස්සන් තරග වැදුණද ජයග්‍රහණය නොකරනු ඇත.

### කාන්තා නියෝජනය

වර්තමාන මැතිවරණ ක්‍රමය තුළ කාන්තාවන් මැතිවරණ සඳහා ඉදිරිපත්වීමේ ප්‍රවණතාව ඉතාම අවමය. කාන්තාවන් ඉදිරිපත් වුවද ජයග්‍රහණය කිරීම ඉතාම අපහසුය. 52% ක ප්‍රතිශතයක් කාන්තාවන් සිටින රටෙහි කාන්තා නියෝජනය 6% ට අඩුය. එය ආසියානු කලාපයේ ඉතා අවම මට්ටමක තිබෙන රට ශ්‍රී ලංකාවයි. එහෙත් සර්වජන ඡන්ද බලය ලැබූ (1931) ප්‍රථම රටවල් අතර ශ්‍රී ලංකාව ඉදිරියෙන් සිටී. ප්‍රජාතන්ත්‍රවාදී මැතිවරණ ක්‍රම ආරම්භ කර දශක දෙකක් නොමැති ඇෆ්ගනිස්ථානයේ පවා කාන්තා නියෝජනය 30% ක් වැනි ඉහළ අගයක් ගෙන ඇත.

කාන්තාවන් වෙනුවෙන් ක්‍රියාකරන කාන්තාවන් දේශපාලනයට කැඳවාගෙන ඊමට කටයුතු කළ යුතුය. එමෙන්ම පවතින බාධක ඉවත්කිරීමට සියළු දෙනා එක්ව කටයුතු කළ යුතුය. එහෙත් දීර්ඝකාලීන අඩිතාලමක් ශක්තිමත් වන තෙක් කාන්තා නියෝජනය වැඩිකිරීම සඳහා කොටා ක්‍රමයක් සකස් කල යුතුය.

## Cartoon by PK

